ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

University of Sri Jayewardenepura

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

External Degrees and Extension Courses Unit

# විශේෂ නිවේදනයයි.

## 2024 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පළමු වසර පළමු අර්ධ වාර්ෂික සම්මන්ත්‍රණ

2024 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට ලියාපදිංචි වූ සිසුන්ගේ පළමු වසර පළමු අර්ධ වාර්ෂික සම්මන්ත්‍රණ මාලාව 2025.01.04 දින සිට ආරම්භ වීමට නියමිතය. ඒ අනුව **2025 ජනවාරි 04 සහ 2025 ජනවාරි 05** දිනයන්හි **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ** පහත සඳහන් දේශන ශාලාවන්හි භෞතිකව පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

| දේශන මාධ්‍යය සහ කාලය | දේශන ශාලාව |
|---|---|
| සිංහල මාධ්‍යය<br>(පෙ.ව. 8.00 සිට ප.ව. 3.30 දක්වා) | මැන්දිස් රෝහණධීර ශාලාව, ශ්‍රී සුමංගල මන්දිරය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>(Mendis Rohanadheera Hall, Sri Sumangala Mandiraya, Faculty of Humanities and Social Sciences/ USJP) |
| ඉංග්‍රීසි මාධ්‍යය<br>(පෙ.ව. 8.00 සිට ප.ව. 3.30 දක්වා) | බලගල්ල ශාලාව, ශ්‍රී සුමංගල මන්දිරය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>(Balagalla Hall, Sri Sumangala Mandiraya, Faculty of Humanities and Social Sciences/ USJP) |

සැලකිය යුතුයි

- දේශන සඳහා සහභාගි වීමේදී ශිෂ්‍ය වාර්තා පොත රැගෙන ඒම අනිවාර්ය වේ. ශිෂ්‍ය වාර්තා පොත ලබාගෙන නොමැති අයෙකු නම් එදිනට ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර දේශන ශාලාවේදී ශිෂ්‍ය වාර්තා පොත ලබා ගත යුතුය. අනන්‍යතාවය තහවුරු කරගත නොහැකි කිසිවෙකු දේශන ශාලාවට ඇතුලත් කරනු නොලැබේ.
- නියමිත වේලාවට දේශන සඳහා සහභාගි විය යුතු අතර ආයතනයේ නීති රීති වලට යටත් විය යුතුය.
- දේශන සඳහා සහභාගි වීමේදී ඔබ විශ්වවිද්‍යාලයට ගැළපෙන ඇඳුමකින් සැරසී පැමිණිය යුතු අතර විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීමට වග බලා ගත යුතුය.

2025.01.18 දින සිට විද්‍යුත් ඉගෙන්නුම් පද්ධතිය (LMS) මගින් මාර්ගගත (Online) ක්‍රමයට දේශන පවත්වනු ලබන අතර ඉදිරියේදී භෞතිකව පවත්වනු ලබන දේශන පිළිබඳ දැනුවත් කිරීම් අපගේ වෙබ් අඩවිය ඔස්සේ සිදු කෙරෙනු ඇත.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-01-01